"නිරෝගිකම පරම සැපතයි"


අධ්‍යක්ෂ
பணிப்பாளர்
Director
081 – 2224336

කාර්යාලය
அலுவலகம்
Office
081 – 2222341/ 081-2220206-8

ෆැක්ස්
பகஸ்
Fax
081 – 2204755


මගේ අංකය
எமது இல
My NO.
CPC/PDHS/A-06/4/2025

ඔබේ අංකය
உமது இல
Your No.

දිනය
திகதி
Date
2025-03-10


# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව – මධ්‍යම පළාත
# சுகாதார திணைக்களம் - மத்திய மாகாணம்
# Department of Health Services – Central Province.

163, සංඝරාජ මාවත, මහනුවර.
163, சங்கராஜ மாவத்தை, கண்டி.
163, Sangaraja Mawatha, Kandy.
Web:www.healthdept.cp.gov.lk


ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
මහනුවර/මාතලේ /නුවරඑළිය

**<u>අතුරු ස්ථාන මාරු නියෝග -2025</u>**

මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල මඟින් සිදු කරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි තනතුරුවලට අදාළ අතුරු ස්ථාන මාරු නියෝග ඇතුළත් ලැයිස්තුව මෙම දෙපාර්තමේන්තුව www.healthdept.cp.gov.lk වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඔබ දිස්ත්‍රික්කය යටතේ අනෙකුත් ආයතන සහ අදාළ නිලධාරීන් නොපමාව දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වමි. (දෘඩ පිටපත අමුණා ඇත)

02. ඒ අනුව, මෙම අතුරු ස්ථාන මාරු නියෝග වලට අදාළ අභියාචනා තිබේනම් ඔබගේ නිර්දේශය සහිතව 2025-03-14 දිනට පෙර මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ස්ථාන මාරු අභියාචනා සලකා බලනු නොලැබේ. නියමිත කාලය තුළ ලැබෙන අභියාචනා පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ලැබේ.

03. මෙය අතුරු ස්ථාන මාරු නියෝගයක් වන අතර, ලැබෙන අභියාචනා සලකා බලා අභියාචනා මණ්ඩලය විසින් නිකුත් කරන තීරණ ද සලකා අවසන් ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ලැබේ.

04. එමෙන්ම ස්ථාන මාරු අයදුම් කළද මෙම ස්ථාන මාරු නියෝග ලේඛනයේ යම්හෙයකින් නම ඇතුළත් නොවන අය සිටී නම් ඔවුන්ටද අභියාචනා සඳහා ඉල්ලුම් කළ හැකි බව වැඩිදුරටත් සඳහන් කරමි.

වෛද්‍ය එම් .එන්. වීරසූරිය
මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

වෛද්‍ය එම්. එන්. වීරසූරිය
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
මධ්‍යම පළාත.

01/c

පිටපත්
01. ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මධ්‍යම පළාත - කාරුණික දැන ගැනීම සඳහා
02. ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පළාත - කාරුණික දැන ගැනීම සඳහා
03. වෛද්‍ය අධිකාරි, දිස්ත්‍රික් මූලික රෝහල තෙල්දෙණිය/දඹුල්ල/රිකිල්ලගස්කඩ/දික්ඔය - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා
04. නියෝජ්‍ය අධ්‍යක්ෂ, (පුහුණු) යටිනුවර - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා
05. ආයතන භාර වෛද්‍ය නිලධාරි, පුනරුත්ථාපන රෝහල, දිගන - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා
06. ජීව වෛද්‍ය ඉංජිනේරු, ජීව වෛද්‍ය කාර්යාලය, වටපුලුව - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා
07. විෂය නිලධාරි,A17/ A02 - අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා